අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/09/12/06/14    ඔබේ යොමුව / உமது இல. / Your Ref.    දිනය / திகதி / Date 2025.11. 04

වක්‍රලේඛ අංක - 34/2025

සියලු ම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය /සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම පරිවේණාධිපති හිමිවරුන්
සියලු ම රජයේ සහ රජයේ අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන් වෙත

<u>නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට සමගාමීව පාසල්වල 6 – 13 ශ්‍රේණි සඳහා පාසල් කාලසටහන සකස් කිරීම</u>

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ සාමාන්‍ය අධ්‍යාපන පද්ධතියට හඳුන්වා දීමට යෝජිත නව විෂයමාලා ප්‍රතිසංස්කරණ 2026 වර්ෂයේ සිට ප්‍රාථමික අංශයේ පළමුවන ශ්‍රේණියටත්, කනිෂ්ඨ ද්විතියික අංශයේ 6 වන ශ්‍රේණියටත් ක්‍රියාත්මක කිරීමට නියමිත ය. ඒ අනුව, ද්විතියික ශ්‍රේණි (6 - 11) සඳහා නව විෂයමාලාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධව මින් පෙර නිකුත් කර ඇති අංක 2006/09 හා 2006.03.07 දිනැති වක්‍රලේඛය අවලංගු කරන අතර, 2026 වර්ෂයේ සිට ඉදිරියට මෙම වක්‍රලේඛයෙහි උපදෙස් 6 - 13 ශ්‍රේණි සඳහා බලපවත්වනු ඇත.

**2.0 කනිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ ද්විතියික ශ්‍රේණි (6 – 11) සඳහා නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම**

2.1 මෙම වක්‍රලේඛය අනුව, කනිෂ්ඨ ද්විතියික ශ්‍රේණි (6 – 9) සඳහා හඳුන්වා දෙන නව විෂයමාලා ප්‍රතිසංස්කරණ 2026 වර්ෂයේ දී 6 ශ්‍රේණිය සඳහා ද 2027 වර්ෂයේ දී 7 ශ්‍රේණිය සඳහා ද, 2028 වර්ෂයේ දී 8 ශ්‍රේණිය සඳහා ද, 2029 වර්ෂයේ දී 9 ශ්‍රේණිය සඳහා ද ක්‍රියාත්මක කරනු ලැබේ. 2026 වර්ෂයේ දී 6 ශ්‍රේණිය සඳහා හඳුන්වා දෙනු ලබන නව විෂයමාලාව හදාරන සිසුන් 2031 වර්ෂයේ දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටීමට නියමිත ය.

2.2 2026 වර්ෂයේ දී 7, 8, 9, 10 හා 11 ශ්‍රේණි සඳහා ද, 2027 වර්ෂයේ දී 8, 9, 10 හා 11 ශ්‍රේණි සඳහා ද, 2028 වර්ෂයේ දී 9 හා 11 ශ්‍රේණි සඳහා ද පැරණි විෂයමාලාව බලපැවැත් වේ.

2.3 ජ්‍යෙෂ්ඨ ද්විතියික ශ්‍රේණි (10 – 11) සඳහා නව විෂයමාලා ප්‍රතිසංස්කරණ 2028 වර්ෂයේ දී 10 ශ්‍රේණිය සඳහා හඳුන්වා දීමට නියමිත අතර, එම නව විෂය නිර්දේශය හදාරන සිසුන් ප්‍රථම වරට 2029 වර්ෂයේ දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටීමට නියමිත ය.

2.4 එය පහත සඳහන් වගුව මගින් ද ඉදිරිපත් කෙරේ.

| වර්ෂය | 6 | 7 | 8 | 9 | 10 | 11 |
|---|---|---|---|---|---|---|
| 2026 | NS | OS | OS | OS | OS | OS |
| 2027 | NS | NS | OS | OS | OS | OS |
| 2028 | NS | NS | NS | OS | NS | OS |
| 2029 | NS | NS | NS | NS | NS | NS |

NS - නව විෂයමාලාව    OS - පැරණි විෂයමාලාව

ගරු අමාත්‍යතුමිය / கௌரவ அமைச்சர் / Hon. Minister +94112784832 +94112784825 minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary +94112784811 +94112785162 secretary.education@moe.gov.lk

**3.0 පාසල් කාලසටහන සකස් කිරීම**

3.1 මෙම චක්‍රලේඛයෙහි උපදෙස් පරිදි, 2026 වර්ෂයේ දී 6 ශ්‍රේණිය සඳහා නව විෂය නිර්දේශය අනුව ද, 7 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා පැරණි විෂය නිර්දේශය අනුව ද, පාසල් කාලසටහන සකස් කර ගත යුතු වේ.

3.2 කනිෂ්ඨ ද්විතියික ශ්‍රේණිවලට අදාළ (6 – 9) නව විෂයමාලා ප්‍රතිසංස්කරණ 2027 වර්ෂයේ දී 7 ශ්‍රේණිය, 2028 වර්ෂයේ දී 8 ශ්‍රේණිය සහ 2029 වර්ෂයේ දී 9 ශ්‍රේණිය සඳහා ක්‍රියාත්මක කෙරෙන බැවින් එක් එක් ශ්‍රේණියට අදාළව නව විෂයමාලා ක්‍රියාත්මක කෙරෙන වර්ෂයේ සිට ඉදිරියට එම ශ්‍රේණි සඳහා මෙම චක්‍රලේඛයේ 3.3හි සඳහන් විෂයයන් සහ කාලච්ඡේද අනුව කාල සටහන සකස් කළ යුතු වේ.

**3.3 6 ශ්‍රේණිය සඳහා නව විෂයමාලා ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම (NS)**

| විෂයයන් | සතියකට වෙන්වන කාලච්ඡේද ගණන |
|---|---|
| මව්බස | 3 |
| ඉංග්‍රීසි භාෂාව | 3 |
| දෙවන ජාතික භාෂාව | 1 |
| ගණිතය | 3 |
| විද්‍යාව | 3 |
| සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය | 2 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 2 |
| ජීවිතය සඳහා තාක්ෂණවේදය | 2 |
| භූගෝල විද්‍යාව | 1 |
| ඉතිහාසය | 2 |
| පුරවැසි අධ්‍යාපනය | 1 |
| ආගම හා සාරධර්ම අධ්‍යාපනය (බුද්ධ ධර්මය/ කතෝලික ධර්මය/ ක්‍රිස්තියානි ධර්මය/ ශෛවනෙරි ධර්මය/ /ඉස්ලාම් ධර්මය) | 2 |
| සෞන්දර්ය අධ්‍යාපනය | 2 |
| ව්‍යවසායකත්වය හා මූල්‍ය සාක්ෂරතාවය | 1 |
| ක්‍රීඩා, පුස්තකාල, සමිති සමාගම් සහ සංගම් | 2 |
| වැඩිදුර ඉගෙනුම් මොඩියුල | 3 |
| පරිවර්තනීය කුසලතා මොඩියුල | 2 |
| **මුළු එකතුව** | **35** |

- සෞන්දර්ය විෂයයන් යටතට අයත් වනුයේ අංක 6.1.2.2 හි සඳහන් විෂයයන් ය.

ක්‍රීඩා, පුස්තකාල, සමිති සමාගම් සහ සංගම් සඳහා සතියකට කාලච්ඡේද 02ක් වෙන් කර ඇති අතර, සතියකට එක් කාලච්ඡේදයක් ක්‍රීඩා සඳහා ද අනෙක් කාලච්ඡේදය පුස්තකාල භාවිතය හා සමිති සමාගම් හා සංගම් කටයුතු සඳහා සුදුසු පරිදි යොදා ගැනීමට කටයුතු කළ යුතු ය.

### 3.4 කනිෂ්ඨ ද්විතියික ශ්‍රේණි සඳහා පැරණි විෂයමාලාව ක්‍රියාත්මක කිරීම (OS)

| විෂයයන් | සතියකට වෙන්වන කාලච්ඡේද ගණන |
|---|---|
| ආගම (බුද්ධ ධර්මය/ කතෝලික ධර්මය/ ක්‍රිස්තියානි ධර්මය/ ශෛවනෙරි ධර්මය/ /ඉස්ලාම් ධර්මය) | 2 |
| සිංහල භාෂාව හා සාහිත්‍යය/ දෙමළ භාෂාව හා සාහිත්‍යය | 4 |
| ඉංග්‍රීසි | 4 |
| ගණිතය | 4 |
| විද්‍යාව | 4 |
| ඉතිහාසය | 2 |
| භූගෝල විද්‍යාව | 2 |
| පුරවැසි අධ්‍යාපනය | 2 |
| සෞන්දර්ය විෂයයන් | 3 |
| ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා | 2 |
| සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය | 2 |
| දෙවන භාෂාව ලෙස සිංහල/ දෙමළ | 2 |
| පුස්තකාල භාවිතය | 1 |
| ➢ වෙන් නොකරන ලද කාලච්ඡේද | 1 |
| **මුළු එකතුව** | **35** |

- සෞන්දර්ය විෂයයන් යටතට අයත් වනුයේ අංක 6.1.2.2 හි සඳහන් විෂයයන් ය.

වෙන් නොකරන ලද කාලච්ඡේදය ප්‍රායෝගික තාක්ෂණ විෂයය සඳහා හෝ තොරතුරු තාක්ෂණ විෂයය ක්‍රියාත්මක කිරීම සඳහා හෝ විදුහල්පතිගේ අභිමතය පරිදි යොදා ගැනීමට කටයුතු කළ යුතු ය.

### 3.5 ජ්‍යෙෂ්ඨ ද්විතීයික ශ්‍රේණි (10 – 11) සඳහා පැරණි විෂයමාලාව ක්‍රියාත්මක කිරීම (OS)

| විෂයයන් | සතියකට වෙන්වන කාලච්ඡේද ගණන |
|---|---|
| ආගම (බුද්ධ ධර්මය/ කතෝලික ධර්මය/ ක්‍රිස්තියානි ධර්මය/ ශෛවනෙරි ධර්මය / ඉස්ලාම් ධර්මය) | 2 |
| සිංහල භාෂාව හා සාහිත්‍යය/ දෙමළ භාෂාව හා සාහිත්‍යය | 4 |
| ගණිතය | 5 |
| ඉංග්‍රීසි | 4 |
| ඉතිහාසය | 3 |
| විද්‍යාව | 5 |
| පළමුවන විෂය කාණ්ඩයේ විෂයයන් | 3 |
| දෙවන විෂය කාණ්ඩයේ විෂයයන් | 3 |
| තෙවන විෂය කාණ්ඩයේ විෂයයන් | 3 |
| පුස්තකාල භාවිතය | 1 |
| වෙන් නොකරන ලද කාලච්ඡේද | 2 |
| **මුළු එකතුව** | **35** |

වෙන් නොකරන ලද කාලච්ඡේද 02 ක්‍රීඩා හෝ වෙනත් අධ්‍යයන කාර්යයන්, සිංහල හෝ ඉංග්‍රීසි සාහිත්‍ය සංගම් වැනි විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා විදුහල්පතිගේ අභිමතය පරිදි යොදා ගැනීමට කටයුතු කළ යුතු ය.

**3.6 12 සහ 13 ශ්‍රේණි සඳහා පැරණි විෂයමාලාව ක්‍රියාත්මක කිරීම (OS)**

| විෂයයන් | සතියකට වෙන්වන කාලච්ඡේද ගණන |
|---|---|
| එක් එක් විෂය ධාරාව යටතේ - I විෂය | 9 |
| එක් එක් විෂය ධාරාව යටතේ - II විෂය | 9 |
| එක් එක් විෂය ධාරාව යටතේ - III විෂය | 9 |
| සාමාන්‍ය ඉංග්‍රීසි | 5 |
| සාමාන්‍ය තොරතුරු තාක්ෂණය / ව්‍යාපෘති | 2 |
| පුස්තකාල භාවිතය | 1 |
| මුළු එකතුව | 35 |

3.7 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අනුව පාසල්වල ක්‍රියාත්මක කළ යුතු කාලසටහන තුළ සිසුන්ට ක්‍රියාකාරකම්වල නිසි පරිදි යෙදීම සඳහා මිනිත්තු 50ක කාලච්ඡේද ඇතුළත් වන අතර දිනකට කාලච්ඡේද 07ක් ඇතුළත් වන පරිදි 6 ශ්‍රේණිය සිට 13 ශ්‍රේණිය දක්වා සියලු ම ශ්‍රේණිවල පාසල් කාලසටහන පහත පරිදි සකස් කර ගත යුතු වේ.

| වේලාව | දිනය |
|---|---|
| පෙ.ව. 7.30 – පෙ.ව.7.40 | උදෑසන රැස්වීම හා ආගමික වතාවත් සිදු කිරීම |
| පෙ.ව. 7.40 – පෙ.ව. 8.30 | පළමු කාලච්ඡේදය |
| **පෙ.ව. 8.30 – පෙ.ව. 8.35** | **නාමලේඛන ලකුණු කිරීම** |
| පෙ.ව. 8.35 – පෙ.ව. 9.25 | දෙවන කාලච්ඡේදය |
| පෙ.ව. 9.25 – පෙ.ව. 10.15 | තෙවන කාලච්ඡේදය |
| **පෙ.ව. 10.15 – පෙ.ව.10.40** | **විවේක කාලය** |
| පෙ.ව. 10.40 – පෙ.ව.11.30 | සිව්වන කාලච්ඡේදය |
| පෙ.ව.11.30 - ප.ව. 12.20 | පස්වන කාලච්ඡේදය |
| ප.ව.12.20 - ප.ව. 1.10 | හයවන කාලච්ඡේදය |
| ප.ව.1.10 - ප.ව. 2.00 | හත්වන කාලච්ඡේදය |

3.8 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අනුව මුස්ලිම් පාසල් සඳහා පාසල් කාලසටහන සකස් කිරීම සම්බන්ධ උපදෙස් මුස්ලිම් පාසල් සංවර්ධන ශාඛාව මගින් නිකුත් කරනු ලැබේ.

**4.0 කනිෂ්ඨ ද්විතීයික ශ්‍රේණි (6 – 9 ශ්‍රේණි) නව විෂයමාලාව**

4.1 කනිෂ්ඨ ද්විතීයික මට්ටම සඳහා මොඩියුල පාදක (Module basis) සහ සම්භාර පාදක (Credit basis) විෂයමාලාවක් හඳුන්වා දී ඇති අතර, එම නව විෂයමාලාව 2026 වර්ෂයේ දී 6 ශ්‍රේණිය සඳහා ක්‍රියාත්මක කිරීමට නියමිත ය.

4.1.1 අනිවාර්ය විෂයයන්

සියලු ම සිසුන් අනිවාර්ය විෂයයන් 14ක් හැදෑරීම අවශ්‍ය වන අතර, එම අනිවාර්ය විෂයයන් 14 මොඩියුල මඟින් ඉගැන්වීම සිදු කෙරේ. විෂයයන් අනුව, වාරයකට ඉගෙනීමට අවශ්‍ය මොඩියුල සංඛ්‍යාව තීරණය වේ.

1. මව්බස
2. ඉංග්‍රීසි භාෂාව
3. දෙවන ජාතික භාෂාව
4. ගණිතය
5. විද්‍යාව
6. සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය
7. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
8. ජීවිතය සඳහා තාක්ෂණවේදය
9. භූගෝල විද්‍යාව
10. ඉතිහාසය
11. පුරවැසි අධ්‍යාපනය
12. ආගම හා සාරධර්ම අධ්‍යාපනය (බුද්ධ ධර්මය/ කතෝලික ධර්මය/ ක්‍රිස්තියානි ධර්මය/ ශෛවනෙරි ධර්මය / ඉස්ලාම් ධර්මය)
13. සෞන්දර්ය අධ්‍යාපනය
14. ව්‍යවසායකත්වය හා මූල්‍ය සාක්ෂරතාවය

4.1.2.වැඩිදුර ඉගෙනුම් මොඩියුල

යම් විෂය ක්ෂේත්‍රයක් තුළ සිසුන්ගේ දැනුම සහ කුසලතා තවදුරටත් සංවර්ධනය කර ගත හැකි පරිදි හා සිසුන්ගේ කැමැත්ත පරිදි එක් වාරයකට වැඩිදුර ඉගෙනුම් මොඩියුල 03ක් අධ්‍යයනය කළ යුතු වේ. සෑම අනිවාර්ය විෂයයක් සඳහාම වැඩිදුර ඉගෙනුම් මොඩියුල පවතින අතර සිසුවාගේ කැමැත්ත අනුව වාරයකට මොඩියුල 03 ක් තෝරා ගත හැකි ය.

4.1.3.පරිවර්තනීය කුසලතා මොඩියුල

හඳුන්වා දී ඇති පරිවර්තනීය කුසලතා මොඩියුල අතරින් සිසුන්ගේ කැමැත්ත පරිදි එක් වාරයකට මොඩියුල 02ක් තෝරා ගත හැකි ය.

5.0 කනිෂ්ඨ ද්විතීයික ශ්‍රේණි පැරණි විෂයමාලාව

1. ආගම (බුද්ධ ධර්මය/ කතෝලික ධර්මය/ ක්‍රිස්තියානි ධර්මය/ ශෛවනෙරි ධර්මය/ ඉස්ලාම් ධර්මය)
2. සිංහල භාෂාව හා සාහිත්‍යය/ දෙමළ භාෂාව හා සාහිත්‍යය
3. ඉංග්‍රීසි
4. ගණිතය
5. විද්‍යාව
6. ඉතිහාසය
7. භූගෝල විද්‍යාව
8. පුරවැසි අධ්‍යාපනය
9. සෞන්දර්ය විෂයයන්

10. ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා
11. සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය
12. දෙවන භාෂාව ලෙස සිංහල/දෙමළ

## 6.0 ජ්‍යෙෂ්ඨ ද්විතීයික ශ්‍රේණි (10 – 11 ශ්‍රේණි) පැරණි විෂයමාලාව

6.1 ජ්‍යෙෂ්ඨ ද්විතීයික ශ්‍රේණි සඳහා ක්‍රියාත්මක වන පැරණි විෂයමාලාව හර විෂයයන් හා කාණ්ඩ විෂයයන් යනුවෙන් කොටස් දෙකකින් සමන්විත ය. හර විෂයයන් 06 කි. කාණ්ඩ විෂයයන් කාණ්ඩ 03ක් යටතේ ගොනු කර ඇති අතර එම කාණ්ඩ තුනෙන් එක් කාණ්ඩයකින් එක් විෂයයක් බැගින් විෂයයන් 03ක් තෝරා ගත යුතු වේ. මේ අනුව සියලු ම සිසුන් විසින් හර විෂයයන් 06ක් හා කාණ්ඩ විෂයයන් 03ක් ඇතුළුව විෂයයන් 09ක් හදාරනු ලැබිය යුතු වේ.

6.1.1 හර විෂයයන්

සියලු ම සිසුන් මෙම විෂයයන් 06 ම හැදෑරිය යුතු ය.

1. ආගම (බුද්ධ ධර්මය/ කතෝලික ධර්මය/ ක්‍රිස්තියානි ධර්මය/ ශෛවනෙරි ධර්මය/ ඉස්ලාම් ධර්මය)
2. සිංහල භාෂාව හා සාහිත්‍යය / දෙමළ භාෂාව හා සාහිත්‍යය
3. ගණිතය
4. ඉංග්‍රීසි
5. ඉතිහාසය
6. විද්‍යාව

6.1.2 කාණ්ඩ විෂයයන්

පහත සඳහන් විෂය කාණ්ඩයන්ගෙන් එක් කාණ්ඩයකින් එක් විෂයයක් පමණක් තෝරා ගත යුතු ය.

6.1.2.1 පළමු විෂය කාණ්ඩය

1. භූගෝල විද්‍යාව
2. පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය
3. ව්‍යවසායකත්ව අධ්‍යයනය
4. සම්භාව්‍ය භාෂා හා නූතන භාෂා (පාලි/සංස්කෘත/ප්‍රංශ/ජර්මන්/හින්දි/ජපන්/අරාබි/චීන/රුසියන්/කොරියන්)
5. දෙවන භාෂාවක් ලෙස සිංහල/දෙමළ
6. ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

6.1.2.2 දෙවන විෂය කාණ්ඩය

1. පෙරදිග සංගීතය (සිංහල මාධ්‍ය)
2. කර්ණාටක සංගීතය (දෙමළ මාධ්‍ය)
3. බටහිර සංගීතය (ඉංග්‍රීසි මාධ්‍ය)
4. දේශීය නර්තනය (සිංහල මාධ්‍ය)
5. භරත නාට්‍යම් (දෙමළ මාධ්‍ය)
6. නාට්‍ය හා රංග කලාව (සිංහල මාධ්‍ය/දෙමළ මාධ්‍ය/ඉංග්‍රීසි මාධ්‍ය)
7. චිත්‍ර කලාව (සිංහල මාධ්‍ය/දෙමළ මාධ්‍ය)
8. සාහිත්‍ය රසාස්වාදය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි/අරාබි)

6.1.2.3 තෙවන විෂය කාණ්ඩය

1. තොරතුරු සන්නිවේදන තාක්ෂණය
2. කෘෂි හා ආහාර තාක්ෂණය
3. ජලජ ජීව සම්පත් තාක්ෂණය
4. නිර්මාණකරණය හා තාක්ෂණවේදය
5. ශිල්ප කලා
6. ගෘහ ආර්ථික විද්‍යාව
7. විද්‍යුත් ලේඛනකරණය හා ලඝුලේඛනය
8. සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය
9. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

## 7.0 උසස් පෙළ (12 – 13 ශ්‍රේණි) පැරණි විෂය නිර්දේශය

12 සහ 13 ශ්‍රේණි සඳහා අංක 2016/13 සහ 2016.04.26 දිනැති අ.පො.ස. (උසස් පෙළ) විෂය සංයෝජන හා විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා වූ විෂය සංයෝජන යන චක්‍රලේඛය සහ ඊට අදාළ අනෙකුත් සංශෝධිත චක්‍රලේඛ හෝ උපදෙස් ලිපිවල සඳහන් විෂය සංයෝජනයන් තවදුරටත් ක්‍රියාත්මක කෙරෙන අතර, විෂයයන් සඳහා නියමිත කාලච්ඡේද සංඛ්‍යාව පමණක් මෙම නව චක්‍රලේඛය අනුව සංශෝධනය විය යුතු ය.

## 8.0 පොදු කරුණු

8.1 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ විෂය ඉගැන්වීමේ දී විෂය නිර්දේශයන් හි සහ මොඩියුලවල සඳහන් උපදෙස්වලට අනුකූල වන පරිදි පාසල්වල ඉගැන්වීම් කටයුතු සංවිධානය කිරීමට විශේෂයෙන් සැළකිලිමත් විය යුතු ය.

8.2 මෙම චක්‍රලේඛයෙහි සඳහන් නව විෂය නිර්දේශයට අදාළව ජාතික අධ්‍යාපන ආයතනය විසින් සම්පාදිත මොඩියුල සහ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණය කර අදාළ නියමිත කාලය තුළ දී පාසල්වලට ලබා දීමට කටයුතු කරනු ලැබේ.

8.3 මෙම චක්‍රලේඛ විධිවිධාන සම්බන්ධයෙන් මතුවන ඕනෑම ගැටලුවක් පිළිබඳව අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

8.4 මෙම චක්‍රලේඛයේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

නාලක කළුවැව
ලේකම්

පිටපත් -

1. සියලු ම පළාත් ආණ්ඩුකාර ලේකම්වරුන්
2. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති
3. ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
4. විභාග කොමසාරිස් ජනරාල්
5. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
6. අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ම මාණ්ඩලික නිලධාරීන් හා ශාඛා ප්‍රධානීන්